Department of Education, Sabaragamuwa Province/ Weekly School

# පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - සබරගමුව
## සති පාසල

විෂය - පෙරදිග සංගීතය

ශ්‍රේණිය - 9

අප්‍රේල් මාසය - 4 සතිය

සැකසුම - ගයානි චන්ද්‍රකාන්ති
ර/නිව්/ඇලපාත මහා විද්‍යාලය

## පුනරීක්ෂණ අභ්‍යාස - 4

(1) i. එකෝඩියනය බටහිරින් ආරම්භ වී ලොව පුරා ව්‍යාප්ත වී ඇති ස්වර පුවරු භාණ්ඩයකි.

එකෝඩියනයේ පහත දැක්වෙන කොටස් හඳුනාගෙන නම් කරන්න.



ii. වරහන් තුළින් නිවැරදි පිළිතුර තෝරා එකෝඩියනයේ ස්වභාවය පිළිබඳ පහත දී ඇති ඡේදය සම්පූර්ණ කරන්න.

(වමතින්/දකුණතින්/සරල සංගීතය/පියානෝ එකෝඩියන්/සුෂිර/බටන් එකෝඩියන්/බටහිර)

එකෝඩියනය -------------- වාද්‍ය භාණ්ඩයකි. මෙය ------------ සංගීත භාණ්ඩයක් වුව ද පෙරදිග ද බහුල ව භාවිත වේ. ----------- සඳහා යොදාගෙන ඇති අතර එකෝඩියනයේ ස්වර පුවරුව --------- හා බේස් පුවරුව ----------- වාදනය කෙරේ. --------- හා ------- වශයෙන් එකෝඩියන් වර්ග දෙකකි.

(2)

i. විවිධ මාත්‍රා ගණනින් යුත් හින්දුස්ථානී තාල පද ඇත. ඔබ උගත් මාත්‍රා 2/3 අනුව මත් කැටි වන තාල පදය නම් කර, නියමිත තාල සංඥා අනුව ප්‍රස්තාර කර දක්වන්න.

ii. එම තාලපදයට ගැළපෙන දේශීය තිත් රූපය හා බටහිර තාලය කුමක්ද?

iii. "හින්දුස්ථානි තාල හා දේශීය තාල අතර සම විෂමතා දක්නට ලැබේ". මෙම කියමන නිදසුන් සහිත ව පහදන්න.

iv. /xx/xx/xx/xx/

/xx/x-/xx/x-/

/x-/xx/x-xx/

මෙහි දැක්වෙන්නේ මාත්‍රා දෙකේ රිද්ම රටාවක් කිහිපයකි. ඒ ආකාරයට මාත්‍රා 3 සහ 4 රිද්ම රටා කිහිපයක් නිර්මාණය කරන්න.

(3). i. පහත සඳහන් ස්වර අභ්‍යාස උච්ච සඩ්ජය (සˈ) දක්වා ගොඩනගන්න.

- ❖ සරිග,රිගම --------
- ❖ සරිගම,රිගමප -----------
- ❖ සරිසරිග,රිගරිගම----------

ii.පහත ස්වර අභ්‍යාසවල තෙවන පියවර ලියන්න.

- සරිගස,රිගමරි-------------
- සගරිස,රිමගරි-------------
- සරිස, රිගරි-----------
- සරිසග,රිගරිම-----------
- සරිගරි,රිගමග-----------

(4).

i. වයලින් පවුලට අයත් භාණ්ඩ නම් කරන්න.




ii. පහත එක් එක් හඬතල වලටයත් වයලින් සාමාජිකයා නම් කරන්න.

- සොප්‍රානෝ - --------------
- ඇල්ටො - ----------
- ටෙනර් - -------------
- බේස් -------------

iii. වයලීනය සුසර කරන පෙරදිග හා අපරදිග ක්‍රම ලියා දක්වන්න.

iv. වයලීනයේ ශුද්ධ ස්වර 7 පිහිටන ආකාරය දළ රූපසටහනක් මගින් පැහැදිලි කරන්න.

v. ඔබ දන්නා පෙර අපර දෙදිග හා ලාංකීය වයලින් වාදකයින් නම් කරන්න.